## විසර්ජන ශීර්ෂය 256 ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල

## ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව

1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

* දිළිඳුකම අඩුකිරීම සඳහා වන මූලපිරීම
* මැතිවරණ සම්බන්ධීකරණය
* සංවර්ධන ව්‍යාපෘත සැලසුම් කිරීම හා අධීක්ෂණය
* ආපදා සහක ව්‍යාපෘති හා පුනරුත්ථාපන ව්‍යාපෘතීන් පරිපාලන
* දිස්ත්‍රික් ව්‍යාපෘතින් පරිපාලනය හා මග පෙන්වීම
* ආදායම් එකතු කිරීම

2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල

| | | | |
|---|---|---|---|
| අත්තනගල්ල | ගම්පහ | මහර | වත්තල |
| බියගම | ජාඇල | මිනුවන්ගොඩ | |
| දොම්පෙ | කටාන | මීරිගම | |
| දිවුලපිටිය | කැලණිය | මීගමුව | |

3. වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම ගිණුම් වර්ෂයේ ආරම්භයේ පිළියෙල කර නොතිබුණි.

4. ගිණුම්

4.1 මුළු ප්‍රතිපාදනය හා වියදම

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ වූ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 13 ක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 561,925,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු550,639,958 ක් උපයෝජනය කර තිබුණි.

ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ශුද්ධ ඉතිරි කිරීම් රු. 11,285,042 ක් වූ අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 2.01 ක් විය. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | දෙපාර්තමේන්තුව | ශුද්ධ ප්‍රතිපාදනය | | උපයෝජනය | | ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 256 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 27,325,000 | 29,250,000 | 26,120,093 | 27,505,651 | 1,204,907 | 1,744,349 |
| | ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 505,000,000 | 350,000 | 496,764,564 | 249,650 | 8,235,436 | 100,350 |
| | එකතුව | 532,325,000 | 29,600,000 | 522,884,657 | 27,755,301 | 9,440,343 | 1,844,699 |

## 4.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙතින් පහත සඳහන් පරිදි එකතුව රු**5,555,580,019**ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඒවා උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන ලබා දුන් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ලබා දුන් ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිය (2010 දෙසැම්බර් 31 දිනට) |
|---|---|---|---|---|
| | | රු. | රු | රු |
| 101 | බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 1,510,000 | 1,459,246 | 50,754 |
| 103 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 99,875 | 82,825 | 17,050 |
| 105 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 2,859,650,972 | 2,146,193,402 | 713,457,570 |
| 106 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 33,384,992 | 31,212,861 | 2,172,131 |
| 110 | අධිකරණ අමාත්‍යාංශය | 2,688,087 | 2,006,283 | 681,804 |
| 117 | මහා මාර්ග අමාත්‍යාංශය | **20,000** | **19,824** | **176** |
| 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 132,000 | 84,785 | 47,215 |
| 120 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 10,132,767 | 8,363,906 | 1,768,861 |
| 121 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 3,839,462 | 3,793,131 | 46,331 |
| 124 | සමාජ සේවා අමාත්‍යාංශය | 5,472,694 | 5,311,834 | 160,860 |
| 127 | කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 306,500 | 236,361 | 70,139 |
| 128 | සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා | 1,272,450 | | |

| | | | | |
|---|---|---|---|---|
| | ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | | 1,095,019 | 177,431 |
| 133 | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 8,887,457 | 7,187,338 | 1,700,119 |
| 134 | ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 129,320 | 128,440 | 880 |
| 139 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 5,543,086 | 5,393,405 | 149,681 |
| 142 | ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 4,013,909 | 95,066 | 3,918,843 |
| 145 | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය | 4,541,572 | 3,803,296 | 738,276 |
| 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 50,372,522 | 47,190,745 | 3,181,777 |
| 156 | යෞවන කටයුතු අමාත්‍යාංශය | 1,076,750 | 1,008,148 | 68,602 |
| 160 | පරිසර අමාත්‍යාංශය | **2,255,560** | **1,701,361** | **554,199** |
| 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 7,224,389 | 6,729,411 | 494,978 |
| 204 | හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 200,000 | 100,000 | 100,000 |
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 5,000 | 3,134 | 1,866 |
| 210 | ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 8,000 | 8,000 | - |
| 216 | සමාජසේවා දෙපාර්තමේන්තුව | 8,080,325 | 6,936,599 | 1,143,726 |
| 217 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව. | 4,648,056 | 4,622,765 | 25,291 |
| 218 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව. | **962,254,476** | **715,307,791** | **246,946,685** |
| 226 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | 1,725 | 915 | 810 |
| 227 | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේනතුව. | 30,300 | 22,648 | 7,652 |
| 252 | ජන ලේඛන හා සංඛ්‍යා ලෙඛන දෙපාර්තමේන්තුව | 1,962,715 | 1,625,166 | 337,549 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව. | 1,575,098,048 | 1,533,935,193 | 41,162,855 |
| 282 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව. | 156,000 | 156,000 | - |
| 286 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව. | 22,360 | 22,360 | - |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | **558,650** | **331,717** | **226,933** |
| | | -------------- | ----------------- | ---------------- |
| | | 5,555,580,019 | 4,536,168,975 | 1,019,411,044 |
| | | ========= | ========== | ========= |

4.3 විගණනය හා විගණන විෂය පථය

ගම්පහ .දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ **2010** දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011 දෙසැම්බර් 12 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

4.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

4.5 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණය

**2010** දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනවල තත්ත්වය ප්‍රකාශ වන, මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 4.6 සිට 4.13 දක්වා වූ ඡේදවල ඇතුලත් වෙනත් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) ගිණුම් ඉදිරිපත් කිරීම

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් **2011** මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ශීර්ෂය | ගිණුමේ නම | ගිණුම් ඉදිරිපත් කළ දිනය |
|---|---|---|
| **256** | විසර්ජන ගිණුම | 2011 මැයි 09 |

(ii) ජංගම නොවන වත්කම් පිළිබඳ සංචලන වාර්තා අනුව වර්ෂය අවසානයට වූ රු.96,447,286 ක ස්ථාවර වත්කම් වල නරවද්‍යතාවය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ස්ථාවර වත්කම් ලේඛන පිළියෙල කර නොතිබීම නිසා තහවුරු කරගත නොහැකි විය.

(ආ) අයවැය විචලනය

**වැය විෂයයන් 14ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් 7 % ත් 51 % අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.**

(ඇ) අග්‍රිම ගිණුම

**භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2010 නොවැම්බර් 04 දිනැති අංක 6/2010 දරන චක්‍රලේඛයේ 2.2.2 ජේදය ප්‍රකාර 2011 ජනවාරි 05 දින වන විට අග්‍රිම ශේෂය නිරවුල් කළ යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 විසින් අග්‍රිම ශේෂ පියවීමේ ප්‍රමාදයන් හේතු කොට ගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2010 දෙසැම්බර් 31 දිනට වූ රු.50,423,061 ක ශේෂය 2011 ජනවාරි සිට මාර්තු අවසානය දක්වා වූ කාලය තුළ අවස්ථා 03 කදී පියවා තිබුණි.**

(ඈ) පොදු තැන්පත් ගිණුම

**වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.782,608 ක් අදාළ කාර්යයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.**

(ඉ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

**විෂය අංක 25601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය අනුව 2010 දෙසැම්බර් 31 දින වන විට අයවිම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු. 1,700,215 ක්වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.**

4.6 <u>වත්කම් කළමනාකරණය</u>

<u>වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම</u>

මුදල් රෙගුලාසි 756 හා අංක PF/FS/Board of survey/01 හා 2010 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2011 මාර්තු 15 ට පෙර 2010 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ පැවැත්විය යුතු වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08ක භාණ්ඩ සමීක්ෂණ 2011 මාර්තු 15 දිනෙන් පසුව සිදු කර තබුණි.

4.7 <u>අනුකූල නොවීම්</u>

<u>නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම</u>

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට යොමුව. | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | මුදල් රෙගුලාසි | | |
| | i. මු.රෙ.371 | 211,200 | තත්කාර්ය අතුරු අග්‍රිම , කාර්ය නිමවූ වහාම පියවිය යුතු වුවත් අතුරු අග්‍රිම 11 ක් මාස 2 සිට 8 දක්වා කාල පමාවකින් පසු පියවා තිබුණි. |
| | ii. මු.රෙ.1646 | 158,054 | එක් එක් මාසය සඳහා වාහන වල දෛනික ධාවන සටහන් ඊළඟ මාසයේ 15 වන දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහනයකට අදාල දෛනික ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දරන ලද වියදම් පිළිබඳ සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය. |
| (ආ) | <u>දිස්ත්‍රික් ලේකම්ගේ චක්‍රලේඛ</u> | -- | |
| | i. 2007 ජූනි 29 දිනැති අංක 1/8/18 දරන චක්‍රලේඛය | | I. සෑම ග්‍රාම නිලධාරී කාර්යාලයක්ම අවම වශයෙන් වසරකට හතර වතාවක්වත් පරීක්ෂා කළ යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ග්‍රාම නිලධාරී වසම් පරීක්ෂා කිරීම් පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ. |

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | මුළු වසම් සංඛ්‍යාව | පරීක්ෂා කළ වාර ගණන | පරීක්ෂා කළ/ නොකළ වසම් ගණන |
|---|---|---|---|
| මීරිගම | 149 | 1 | 28 |
| | | පරීක්ෂා කර නැත | 121 |
| දොම්පෙ | 133 | 1 | 1 |

| | | | |
|---|---|---|---|
| | | පරීක්ෂා කර නැත | 132 |
| ගම්පහ | 101 | 1 | 6 |
| | | 2 | 74 |
| | | 3 | 21 |
| කටාන | 79 | 1 | 26 |
| | | පරීක්ෂා කර නැත | 53 |

II. සෑම කාර්තුවක්ම ආරම්භයේදී ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ග්‍රාම නිලධාරී කාර්යාල පරීක්ෂාව පිළිබඳ වැඩ සටහනක් සකස් කළ යුතු වුවද, දොම්පෙ සහ කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාල එවැනි වැඩසටහනක් සකස් කර නොතිබුණි.

III කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන ග්‍රාම නිලධාරී විසින් පරීක්ෂා කරන ලද කාර්යාල පරීක්ෂණ වාර්තා වල අවස්ථා 3 කදී ග්‍රාම සේවා නිලධාරීන් අත්සන් කර නොතිබුණි.

| | | |
|---|---|---|
| iii. දිස්ත්‍රික් ලේකම්ගේ 2007 ජුනි 10 දිනැති අංක 1/1/17 දරන ලිපිය | 42,717 | I ගමන් වියදම් ඉල්ලුම්පත් සමඟ නිලධාරීන් කළ වැඩ වාර්තා ඉදිරිපත් කළ යුතු වුවද, කළ වැඩ වාර්තාව ලබා නොගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 5 දෙනෙකු සඳහා එකතුව රු.42,717 ක ගමන් වියදම් සහ සංයුක්ත දීමනා ගෙවා තිබුණි. |
| | 10,695 | II ඉදිරි වැඩ සටහන් හා කළවැඩ වාර්තා ඉදිරිපත් කළ දිනයන් සඳහන් කර නොතිබුණු ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් තුන් දෙනෙකු වෙත රු.10,695 ක් ගමන් වියඋම් සහ සංයුක්ත දීමනා ගෙවා තිබුණි. |

4.8 <u>ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම්</u>

**ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ජේදය අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ප්‍රසම්පාදන සැලසුමක් සකස් කර නොතිබුණි.**

4.9 **පාඩු හා හානි**

**වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පෙර පාසල් වෙත බෙදා දීම සඳහා ලීටර් 15 ජල පෙරණ 10 ක් මිලදී ගැනීමේදී අවම මිල වු රු.2,450 ප්‍රතික්ෂේප කර රු.4,985 බැගින් උපරිම මිලට මිලදී ගැනිම හේතුවෙන් රු.25,350 ක පාඩුවක් සිදුවී තිබුණි.**

4.10 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**අදාළ වර්ෂයේ දි වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විමධ්‍යගත ව්‍යාපෘති 4 ක් යටතේ මිලදී ගෙන තිබු රු.112,959 ක් වු කාය වර්ධන කට්ටල 3 ක්, වොලිබෝල් 4 ක්, ටෙනිස් බෝල 96 ක් , ප්ලාස්ටික් පුටු 10 ක් සහ ප්ලාස්ටික් ජල ටැංකි 9 ක් සමාලෝචිත වර්ෂය අවසානය තෙක් බෙදා ද නොතිබුණි.**

4.11 **කළමනාකරණ දුර්වලතා**

**පහත සඳහන් දුර්වලතාවයන් නිරික්ෂණය විය.**

**(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුලත්ව තිබුණු විගණන ජේද රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පරික්ෂා කිරීමෙන් අනතුරුව මතු වූ කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් කරනු ලැබූ නිර්දේශ, බලධාරින් විසින් ක්‍රියාත්මක කිරීමේදී මන්දගාමී ස්වරූපයක් පෙන්නුම් කෙරිණි.**

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂය | රාජ්‍ය ගිණුම් කාරක සභාවේ රැස්වීමේ දිනය | රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශය |
|---|---|---|---|---|
| වර්ෂය | ජේද අංකය | | | |
| 2006 | 2.4 | රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම 2006.දෙසැම්බර්31 ට අයවීම් හිඟ හිටි ණය ශේෂ එකතුව රු.4,413,253 ක් වු අතර ඉන් රු.474,658 ක් අවු.2 ඉක්මවු පැරණි ශේෂයන් විය. 2010 දෙසැම්බර් 31 දිනට තවදුරටත් නිලධාරින් 5 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.192,495 ක් විය. | 2009 සැප්තැම්බර් 10 | ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට සහ ගණන් නිලධාරියාට විස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස. |
| 2006 | 9.2 | කළමනාකරණ හා | 2009 | සියලුම විගණන විමසුම් |

| | | | | |
|---|---|---|---|---|
| | | විගණන කමිටුව ක්‍රියාත්මක කර නොතිබීම | සැප්තැම්බර් 10 | සම්බන්ධයෙන් සහ කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා කර නිවැරදි කර ගැනීමට පියවර ගන්නා ලෙස. |
| 2006 | 10.8 | කළමනාකරණ දුර්වලතා රජයේ පොදු ගොඩනැගිලි වල ග්‍රාම නිලධාරි කාර්යාල 16 ක් පිහිටුවා තිබුණු අතර ඒ සඳහා වර්ෂ ගණනාවක සිට කාර්යාල දීමනා ගෙවා තිබීම | 2009 සැප්තැම්බර් 10 | කාර්යාල උමනා ආපසු අය කර නොගතහොත් අදාළ ග්‍රාම නිලධාරීන්ට විරුද්ධව කටයුතු කරන ලෙස. |

4.12 <u>මානව සම්පත් කළමනාකරණය</u>

<u>අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු</u>

**2010** දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 61 | 57 | 4 | |
| (ii) | තෘතික මට්ටම | 25 | 18 | 7 | |
| (iii) | ද්විතික මට්ටම | 1653 | 1476 | 177 | |
| (iv) | ප්‍රාථමික මට්ටම | **119** | **112** | **7** | |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | **-** | **01** | **-** | **01** |
| | උප එකතුව | 1858 | 1664 | 195 | 01 |

4.13 අභ්‍යන්තර පාලනය

-------------------

කළමනාකරණ හා විගණන කමිටුව ක්‍රියාත්මක කිරීම

---------------------------------------------------

**මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ වූ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛයට අනුව කාර්තුවකට අවම වශයෙන් එක් වතාවක් වත් විගණන හා කළමනාකරණ කමිටුව රැස්විය යුතු වුවද, 2010 වර්ෂය වෙනුවෙන් කමිටුව රැස්වී තිබුණේ එක් වතාවක් පමණි**